# 3

# ආර්ථික හා සමාජ යටිතල පහසුකම්

බලශක්ති සැපයුම, ප්‍රවාහනය හා විදුලි සංදේශ කටයුතු මෙන්ම සෞඛ්‍ය හා අධ්‍යාපන සේවාවල අඛණ්ඩ ප්‍රගතියක් සමග ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සැපයුම වැඩිදියුණු කිරීම අරමුණු කරගත් පියවර අඛණ්ඩව ක්‍රියාත්මක විය. පිරිවැය පිළිබිඹු වන පරිදි දේශීය ඛනිජ තෙල් මිල ගණන් නිර්ණය කිරීමේ යාන්ත්‍රණයක් මේ වන විට ස්ථාපිත කර ඇත. ඒ අනුව, ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම මධ්‍යයේ, 2015 ජනවාරි මාසයෙන් පසු දේශීය ඛනිජ තෙල් මිල ගණන්වල පළමු ප්‍රධාන මිල සංශෝධනය 2018 මැයි මාසයේදී සිදු කළ අතර, ඉන් අනතුරුව අඛණ්ඩව මිල සංශෝධන මාලාවක් සිදු විය. හිතකර කාලගුණික තත්ත්ව පැවතීම හේතුවෙන් ජල විදුලිබල උත්පාදනය ඉහළ යෑම නිසා 2018 වසරේ පළමු මාස හත තුළදී විදුලිබල උත්පාදනය සඳහා තාප විදුලිබලය මත යැපීම යම් පමණකට සීමා විය. කෙසේ වෙතත්, විදුලිබල ගාස්තු, සාමාන්‍යයෙන් ඒ සඳහා වැය වන පිරිවැයට සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම නිසා විදුලිබලය සඳහා ද පිරිවැය පිළිබිඹු වන පරිදි ගාස්තු නිර්ණය කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම කඩිනම් කළ යුතු බව අවධාරණය කරයි. ප්‍රවාහන යටිතල පහසුකම් පිළිබඳව සැලකීමේදී, මාර්ග හා අධිවේගී මාර්ග ජාලය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක විය. වරාය ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වර්ධනයක් අඛණ්ඩව වාර්තා වූ අතර, සංචාරක පැමිණීම් ඉහළ යෑමත් සමග සිවිල් ගුවන් සේවා අංශයේ ක්‍රියාකාරිත්වය ද වැඩිදියුණු විය. තවද, සමාජ යටිතල පහසුකම් සැපයීමේදී පෞද්ගලික අංශයේ ඉහළ යන සහභාගිත්වයක් සමඟ එම සේවා සැපයීම සඳහා රජය අඛණ්ඩව කටයුතු කළේය. කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්පත්වල පවතින ඇතැම් සීමාවලට විසඳුම් සෙවීම සඳහා පියවර ගෙන ඇත. සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළදී ඉන්ෆ්ලුවෙන්සා හා මී උණ වැනි බෝවන රෝග කිහිපයක ව්‍යාප්තිය ඉහළ ගිය ද, සෞඛ්‍ය ක්ෂේත්‍රය මගින් මහජනයාගේ යහ පැවැත්ම සඳහා අඛණ්ඩව සහාය හිමි විය. තවද, සමාජයේ ආර්ථිකමය වශයෙන් පීඩාවට පත් කාණ්ඩවලට උපකාරී වීම සඳහා සමාජ ආරක්ෂණ ජාල අඛණ්ඩව ක්‍රියාත්මක විය. කෙසේ වෙතත්, රටේ සිදුවෙමින් පවතින ජන විකාශ සංක්‍රමණ හා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හමුවේ, සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම වඩා හොඳින් ඉලක්කගත කිරීමේ අවශ්‍යතාව ද සපුරාලිය යුතුව ඇත. විශේෂයෙන්ම, රාජ්‍ය අංශයේ සම්පත් සීමාසහිත වීම හමුවේ, ඉදිරියේදී ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය හා පවත්වා ගෙන යෑම සඳහා පෞද්ගලික අංශයේ ඉහළ සහභාගිත්වය දිරිමත් කිරිම ද අත්‍යාවශ්‍ය වේ.

3

## ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය

### ඛනිජ තෙල්

- **2017 වසරේ මැද සිට පැවති ගෝලීය බොරතෙල් (බ්‍රෙන්ට්) මිල ඉහළ යෑමේ ප්‍රවණතාව 2018 වසරේ මුල් මාස නවය තුළදී අඛණ්ඩව පැවතුණි.** 2017 වසරේ නොවැම්බර් මාසයේදී ඛනිජ තෙල් අපනයන රටවල සංවිධානය (ඔපෙක්) හා ඔපෙක් නොවන ඛනිජ තෙල් නිපදවන රටවල් සිය නිෂ්පාදන සීමා කිරීමට ඇති කර ගන්නා ලද සම්මුතිය 2018 වසර අවසානය වන තෙක් දීර්ඝ කිරීමට තීරණය කිරීම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන 2014 වසරේ දෙසැම්බර් මාසයෙන් පසුව ප්‍රථම වරට 2018 ජනවාරි මාසය මැද වන විට බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිල එ.ජ. ඩොලර් 70 ඉක්මවිය. එක්සත් ජනපදයේ තෙල් නිෂ්පාදනය ඉහළ යෑමත් සමඟ 2018 පෙබරවාරි මාසයේදී මිල ඉහළ යෑම තරමක් දුරට පාලනය වුවද, මැද පෙරදිග පැවති භූ-දේශපාලනික අස්ථාවරභාවය සහ එක්සත් ජනපදය මගින් ඉරානය මත නැවත වෙළඳ සම්බාධක පනවනු ඇති බවට සිදු කළ වෙළඳපොළ අනුමාන හේතුවෙන් බ්‍රෙන්ට් බොරතෙල් මිල ගණන් ඉන් අනතුරුව අඛණ්ඩව ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2018 මැයි මාසය වන විට බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මාසික සාමාන්‍ය මිල එ.ජ. ඩොලර් 76.88 ක් දක්වා ඉහළ ගියේය. කෙසේ නමුත්, ඔපෙක් සංවිධානය මගින් නිෂ්පාදනය සීමා කිරීමට ගත් තීරණය නිමාවට පත්වනු ඇතැයි වූ වෙළඳපොළ අපේක්ෂා හේතුවෙන් 2018 ජූනි මාසය මුල සිට අගෝස්තු මස මැද දක්වා කාලය තුළ ගෝලීය තෙල් මිල පහළ යෑමේ නැඹුරුවක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, එක්සත් ජනපදය, ඉරානය මත පනවන වෙළඳ සම්බාධක හේතු කරගෙන සැපයුම් පිළිබඳව මතු වූ අවිනිශ්චිතභාවය නිසා 2018 අගෝස්තු මස මැද සිට තෙල් මිල පහළ යෑමේ ප්‍රවණතාව වෙනස් විය. එබැවින්, 2018 සැප්තැම්බර් මාසය අවසානය වන විට බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිල එ.ජ. ඩොලර් 81.93 ක් දක්වා ඉහළ ගියේය. සමාලෝචනය කරන ලද කාලපරිච්ඡේදය තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි (ලං.ඛ.නී.සං.) ආනයන මිල ගණන් බොහෝ දුරට ගෝලීය බොරතෙල් මිල ගණන් අනුගමනය කළේය. ඒ අනුව, 2017 අනුරූප කාලපරිච්ඡේදය තුළදී බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල වූ එ.ජ. ඩොලර් 54.81 ට සාපේක්ෂව 2018 වසරේ මුල් මාස නවය තුළදී ලං.ඛ.නී.සං. හි බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල එ.ජ. ඩොලර් 77.54 දක්වා සියයට 41.5 කින් ඉහළ ගියේය.

**3.1 රූප සටහන**

**ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් (බ්‍රෙන්ට්) සාමාන්‍ය මිල හා ලං.ඛ.නී.සං. විසින් ආනයනය කළ බොරතෙල් මිල**




මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

- **2018 වසරේදී කිහිප වරක්ම ලං.ඛ.නී.සං. හි ඛනිජ තෙල් සිල්ලර මිල ගණන් සංශෝධනය කෙරිණි.** මෙම මිල සංශෝධන සිදු කිරීමේදී ගෝලීය ඛනිජ තෙල් වෙළඳපොළේ ඉහළ යන මිල ගණන්, එ.ජ. ඩොලරයේ අගය පොදුවේ අනෙක් විනිමය අනුපාතිකවලට සාපේක්ෂව වැඩි වීම සහ ලං.ඛ.නී.සං. හි ඉහළ යන මූල්‍ය අලාභ හා ණය මට්ටම සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව, ලං.ඛ.නී.සං. හි පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් සිල්ලර මිල ගණන් 2018 මැයි මසදී මුල් වරට ඉහළ නංවන ලද අතර, මේ වන විට ක්‍රමානුකූලව මිල සංශෝධනය කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. නමුත්, අඩු ආදායම්ලාභී පවුල් හා ධීවර කර්මාන්තය මත ඇති වන බලපෑම සැලකිල්ලට ගෙන රජය විසින් 2018 ජූනි මස 13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි භූමිතෙල් ලීටරයක මිල රුපියල් 70 දක්වා අඩු කරන ලද අතර, දිගටම එහි මිල මෙම පහළ අගයෙහි පවතී. මිල ඉහළ නැංවූ සෑම අවස්ථාවකදීම, ලං.ඛ.නී.සං. සමඟම ලංකා ඉන්දියන් තෙල් සමාගම ද සිය ඛනිජ තෙල් සිල්ලර මිල ගණන් වැඩි කළේය.

- **2018 වසරේ මුල් මාස අට තුළදී දේශීය වෙළඳපොළේ සමස්ත ඛනිජ තෙල් අලෙවියේ වර්ධනය මන්දගාමී විය.** ප්‍රවාහන අංශය සඳහා වූ ඩීසල් අලෙවියේ පහළ යෑම සහ ජල විදුලිබල උත්පාදනය ඉහළ යෑමත් සමග ඛනිජ තෙල් භාවිතයෙන් විදුලිබලය නිපදවීම අඩුවීම නිසා මෙම කාලය තුළදී දේශීය වශයෙන් මුළු ඩීසල් අලෙවිය සියයට 8.6 කින් අඩු විය. තවද, විදුලිබල උත්පාදන අංශයෙන් ඇති වූ අඩු ඉල්ලුම හේතුවෙන් 2018 වසරේ මුල් මාස අට තුළදී දැවිතෙල්

**3.1 සංඛ්‍යා සටහන**

**ලං.ඛ.නී.සං. හි ඛනිජ තෙල් මිල ගණන්වල සිදුකළ මෑතකාලීන සංශෝධන**

| නිෂ්පාදිතය | 2018.05.11 දිනට පෙර පැවති මිල ගණන් | 2018.05.11 දින සිට බලපැවැත්වෙන මිල ගණන් | 2018.07.11 දින සිට බලපැවැත්වෙන මිල ගණන් | 2018.08.11 දින සිට බලපැවැත්වෙන මිල ගණන් | 2018.09.11 දින සිට බලපැවැත්වෙන මිල ගණන් | 2018.10.11 දින සිට බලපැවැත්වෙන මිල ගණන් |
|---|---|---|---|---|---|---|
| පෙට්‍රල් 92 ඔක්ටේන් | 117.00 | 137.00 | 145.00 | ස.නො. | 149.00 | 155.00 |
| පෙට්‍රල් 95 ඔක්ටේන් | 128.00 | 148.00 | 155.00 | 157.00 | 161.00 | 169.00 |
| සුදු ඩීසල් | 95.00 | 109.00 | 118.00 | ස.නො. | 123.00 | ස.නො. |
| සුපිරි ඩීසල් | 110.00 | 119.00 | 129.00 | 130.00 | 133.00 | 141.00 |
| භූමිතෙල් | 44.00 | 101.00 | 70.00 (2018.06.13 දින සිට බලපැවැත්වෙන පරිදි) | ස.නො. | ස.නො. | ස.නො. |
| කාර්මික භූමිතෙල් | 88.00 | 110.00 | ස.නො. | ස.නො. | ස.නො. | ස.නො. |

ස.නො. - සංශෝධනය නොකරන ලදී.

මූලය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

3

අලෙවිය සියයට 2.9 කින් අඩු විය. කෙසේ වුවත්, ප්‍රවාහන අංශයෙන් ඇති කෙරුණු ඉහළ ඉල්ලුම හේතු කරගෙන 2018 මුල් මාස අට තුළදී දේශීය වශයෙන් පෙට්‍රල් අලෙවිය සියයට 7.5 කින් වර්ධනය විය. එම කාලය තුළදී භූමිතෙල් අලෙවිය සියයට 30.9 කින් වර්ධනය විය.


## විදුලිබලය

- **2018 වසරේ පළමු මාස හත තුළදී මුළු විදුලිබල උත්පාදනය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී උත්පාදනය කළ ගි.වො.පැ. 8,488 ට සාපේක්ෂව ගි.වො.පැ. 8,800 ක් දක්වා සියයට 3.7 කින් වර්ධනය විය.** 2018 වසරේ මැයි මාසයේදී ඇති වූ අධික වැසි හා ඉන් අනතුරුව ජල පෝෂක ප්‍රදේශවල පැවති යහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් ජල විදුලිබල උත්පාදනය ඉහළ ගිය අතර, තාප විදුලිබලය මත වූ රඳා පැවැත්ම යම්තාක් දුරකට අඩු විය. ඒ අනුව, 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2018 වසරේ මුල් මාස හත තුළ, සුළු පරිමාණ ජල විදුලිය හැර ජල විදුලිබල උත්පාදනය සියයට 99.5 කින් වර්ධනය විය. මේ අතර, මෙරට ද්‍රව ඉන්ධන භාවිතයෙන් වූ මුළු විදුලිබල උත්පාදනය සියයට 22.6 කින් අඩු විය. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ඇති වූ බිඳවැටීම් කිහිපයක් හේතුවෙන් 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස හත තුළදී ගල් අඟුරුවලින් වූ විදුලිබල ජනනය සියයට 13.5 කින් අඩු විය. මේ අතර, සුළු පරිමාණ ජල විදුලිය සහ සූර්ය බලශක්ති උත්පාදනය වැඩිවීම හේතුවෙන්, 2017 සමාන කාලපරිච්ඡේදය හා සැසැඳීමේදී, 2018 වසරේ පළමු මාස හත තුළදී සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් විදුලිබල ජනනය සියයට 37.2 කින් ඉහළ ගියේය. ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) රටේ මුළු විදුලිබල ජනනයෙන් සියයට 75.6 කට දායකත්වය දක්වන ලද අතර, ඉතිරිය ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන් විසින් ජනනය කරන ලදී. 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ සියයට 5.6 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස හත තුළදී විදුලිබල අලෙවිය සියයට 4.3 කින් ඉහළ ගියේය. 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පිළිවෙළින් සියයට 5.1 ක, සියයට 4.6 ක සහ සියයට 3.7 ක වර්ධනයක් වාර්තා කළ කර්මාන්ත, පොදු කාර්ය සහ ගෘහස්ථ අංශ, විදුලිබල අලෙවියේ වාර්තා වූ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය.

- **රජය මගින්, ලං.වි.ම. සහ පෞද්ගලික අංශය හා එක්ව, පුනර්ජනනීය හා පුනර්ජනනීය නොවන ප්‍රභව ඔස්සේ ස්ථාපිත ජනන ධාරිතාව වැඩි කිරීම සඳහා විවිධ පියවර ක්‍රියාවට නංවනු ලැබේ.** 2018 වසරේ මුල් භාගයේදී ජාතික විදුලිබල පද්ධතියට මෙ.වො. 25 ක් එක් කරන මොරගහකන්ද ජලවිදුලි බලාගාරයේ ඉදිකිරීම් අවසන් කරන ලදී. 2019 වසරේදී උමා ඔය සහ බ්‍රෝඩ්ලැන්ඩ්ස් ජලවිදුලි බලාගාර ආරම්භ කිරීමට නියමිත අතර, තල්පිටිගල ජලවිදුලි බලාගාරය ගොඩනැගීම 2020 වසරේදී අවසන් වෙතැයි අපේක්ෂිතය. තවද, ගිං ගඟ, මොරගොල්ල සහ සීතාවක ගඟ ජලවිදුලි බලාගාර ගොඩනැගීම වසර 2022 වන විට නිම වෙතැයි බලාපොරොත්තු වේ. මේ අතර, 2018 ජුනි මාසය අවසන් වන විට 'සූර්යබල සංග්‍රාමය' වැඩසටහන මගින් මෙ.වො. 65 ක් ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇති අතර, 2019 වන විට මෙමගින් තවත් මෙ.වො. 70 ක් එක් කිරීමට අපේක්ෂා කෙරේ. තවද, ලං.වි.ම. ට අයත් අර්ධ වශයෙන් උත්පාදන ක්‍රියාවලිය පාලනය කළ හැකි

**3.2 රූප සටහන**

**විදුලිබල උත්පාදන හා අලෙවි සංයුතිය (අ)**




(අ) සමස්ත විදුලිබල උත්පාදනයට ආංශික දයකත්වය ප්‍රතිශත අගය මගින් නිරූපණය වේ.
(ආ) සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභවවලට සුළු පරිමාණ ජල විදුලිය, සූර්ය බල, සුළං බල හා ජෛව ස්කන්ධ බලශක්ති ඇතුළත්ය.
(ඇ) ආගමික, රාජ්‍ය, හෝටල් හා වීදි ආලෝක කිරීම් අංශවලට සිදුකළ අලෙවිය ඇතුළත්ය.


මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

මෙ.වො. 100 ක පළමු සුළං බලශක්ති උත්පාදන ක්ෂේත්‍රය 2020 වන විට ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර, මෙ.වො. 275 ක ධාරිතාවයකින් යුතු තවත් සුළං බලාගාරයක් අදියර කිහිපයක් ඔස්සේ ඉදිකිරීමට නියමිතය. පුනර්ජනනීය නොවන බලශක්ති පිළිබඳව සැලකීමේදී, වසර 2019 දී මෙ.වො. 100 ක පාවෙන තාප විදුලි බලාගාරයක් දකුණු පළාතේ ආරම්භ කිරීමට අපේක්ෂිතය. තවද, වසර 2019 හා 2020 වන විට මෙ.වො. 35 ක ගෑස් ටර්බයින විදුලි බලාගාර තුනක් කැළණිතිස්ස විදුලි බලාගාරයෙහි පිහිටුවනු ඇත.

- 2018 ජූනි මස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලං.වි.ම. මගින් ඉදිරිපත් කළ 2018 - 2037 කාල පරාසය සඳහා වන අවම පිරිවැයක් සහිත දිගුකාලීන විදුලි උත්පාදන ව්‍යාප්ති සැලසුමෙහි (**Least Cost Long-Term Generation Expansion Plan**) මූලික සැලසුම සඳහා කොන්දේසි සහිත අනුමැතියක් ලබා දෙන ලදී. 2018 මැයි මාසයේදී විදුලිබල උත්පාදන සංයුතිය පිළිබඳ නව ජාතික ප්‍රතිපත්තියට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර, එමගින් වසර 2030 වන විට විදුලිබල සංයුතියෙන් සියයට 30 ක් ද්‍රවීකෘත ස්වභාවික වායු මගින්ද, සියයට 30 ක් අධි-කාර්යක්ෂම ගල් අඟුරු

**3.3 රූප සටහන**

**නව විදුලිබල සම්බන්ධතා**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

මගින්ද, සියයට 25 ක් මහා පරිමාණ ජලවිදුලි බලාගාර මගින්ද, සියයට 15 ක් ඇවිතෙල් සහ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින්ද සමන්විත විය යුතු බව දක්වා ඇත. තවද, රාජ්‍ය මට්ටමින් ලබාදෙන ද්‍රවීකෘත ස්වාභාවික වායු බලාගාර ස්ථාපනය කිරීම සඳහා ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. බලශක්ති උත්පාදන සංයුතිය පිළිබඳ නව ජාතික ප්‍රතිපත්තිය, මීට පෙර අනුමත කෙරුණු අවම පිරිවැයක් සහිත දිගුකාලීන විදුලි උත්පාදන ව්‍යාප්ති සැලසුමට[1] එරෙහිව ලං.වි.ම. හි ඉංජිනේරු සංගමය මගින් ගනු ලැබූ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග, සහ රාජ්‍ය මට්ටමින් සිදු කරන ගිවිස ගැනීම් ඔස්සේ ගොඩනැංවීමට බලාපොරොත්තු වන මෙ.වො. 1,400 ක ද්‍රවීකෘත ස්වභාවික වායු දහන බලාගාර පිළිබඳව සැලකිල්ලට ගෙන ජූනි මස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලං.වි.ම. මගින් ඉදිරිපත් කරන ලද අවම පිරිවැයක් සහිත දිගුකාලීන විදුලි උත්පාදන ව්‍යාප්ති මූලික සැලසුමට අනුමැතිය ලබාදෙන ලදී. මෑතකදී අනුමත කරන ලද අවම පිරිවැයක් සහිත දිගුකාලීන විදුලි උත්පාදන ව්‍යාප්ති සැලසුම මගින් ඉදිරි වසර විස්ස ඇතුළත ස්ථාපිත ධාරිතාව පුළුල් කිරීම සඳහා මෙ.වො. 2,700 ක ගල් අඟුරු, මෙ.වො. 1,500 ක ස්වාභාවික වායු බලශක්ති, මෙ.වො. 1,389 ක සූර්ය බලශක්ති, මෙ.වො. 1,205 ක සුළං බලශක්ති, මෙ.වො. 842 ක මහා පරිමාණ ජලවිදුලි, මෙ.වො. 320 ක ඇවිතෙල්, මෙ.වො. 215 ක කුඩා පරිමාණ ජලවිදුලි, මෙ.වො. 105 ක ගෑස් ටර්බයින සහ මෙ.වො. 85 ක ජෛව ස්කන්ධ බලශක්ති විදුලි ජනන පද්ධතියට එක් කිරීමට නියමිතය.

1 2017 ජූලි මාසයේදී මීට පෙර අනුමත කරන ලද සැලසුමට අනුව, මෙ.වො. 242 ක මහා පරිමාණ ජලවිදුලි බලාගාර, මෙ.වො. 215 ක සුළු පරිමාණ ජලවිදුලි බලාගාර, මෙ.වො. 1,389 ක සූර්ය බලාගාර, මෙ.වො. 1,205 ක සුළං බලාගාර, මෙ.වො. 85 ක ජෛව ස්කන්ධ බලාගාර, මෙ.වො. 4,800 ක ද්‍රවීකෘත ස්වාභාවික වායු බලාගාර, මෙ.වො. 320 ක ඇවිතෙල් බලාගාර සහ මෙ.වො. 105 ක ගෑස් ටර්බයින බලාගාර රටේ ස්ථාපිත විදුලිබල ධාරිතාවට එක් කිරීමට නියමිතව තිබුණි.

## මාර්ග සංවර්ධනය

- **2018 වසරේ පළමු භාගය තුළදී, මාර්ග සංවර්ධන සහ පුනරුත්ථාපන කටයුතු අඛණ්ඩව සිදු විය.** 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී දරන ලද රුපියල් බිලියන 48.8 ක වියදමට සාපේක්ෂව, 2018 වසරේ පළමු භාගය තුළදී මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ.) මගින් මාර්ග නඩත්තු කිරීම, අධිවේගී මාර්ග හා මහාමාර්ග සංවර්ධනය, මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම, පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම සහ ස්වාභාවික විපත් හේතුවෙන් විනාශ වූ මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා රුපියල් බිලියන 58.5 ක වියදමක් දරන ලදී. 2018 පළමු භාගය තුළදී අධිවේගී මාර්ග ද ඇතුළුව කිලෝමීටර් 12,380 ක දිගකින් යුතු ජාතික මහාමාර්ග මෙන්ම පාලම් 4,662 ක් ද මා.සං.අ. විසින් නඩත්තු කරන ලදී. මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අතර, උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය යටතේ මහනුවර - යාපනය මහාමාර්ගය පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම් අයත් විය. මේ අතර, ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 3 හි දෙවන අදියර යටතේ මාර්ග 16 ක පුනරුත්ථාපන කටයුතු ද මෙම කාල පරිච්ඡේදය තුළදී අවසන් කෙරිණි. මෙම කාලය තුළදී කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. මේ අතර, 'මග නැගුම' ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන වැඩසටහන යටතේ කිලෝමීටර් 122 ක් පුනරුත්ථාපනය කරන ලදී. තවද, කුලුනු මතින් දිවෙන වරාය ප්‍රවේශ මහාමාර්ග ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම් සඳහා වන උපදේශන කටයුතු ද 2018 පෙබරවාරි මාසයේදී නිම කරන ලදී.

- **රටේ අධිවේගී මාර්ග ජාලය පුළුල් කිරීම ද වසරේ පළමු භාගය තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක විය.** මත්තල දක්වා අධිවේගී මාර්ග සම්බන්ධතාවක් සහිතව මාතර සිට හම්බන්තොට දක්වා වූ දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය 2018 වසරේ පළමු භාගය තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, එය 2019 ඔක්තෝබර් මාසය වන විට අවසන් කිරීමට නියමිතය. මේ අතර, පොතුහැර-ගලගෙදර සහ මීරිගම-අඹේපුස්ස අධිවේගී මාර්ග සම්බන්ධතා සහිතව කඩවත සිට දඹුල්ල දක්වා වූ මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සඳහා රජය විසින් ඉහළ ප්‍රමුඛතාවක් ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතියේ සම්පූර්ණ දිග කිලෝමීටර් 169 ක් වන අතර, දැනට ඉඩම් අත්පත් කර ගැනීම, ඉඩම් සංවර්ධනය හා යටිතල පහසුකම් සංවර්ධනය

3

කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. තවද, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයට මාර්ග සම්බන්ධතාවක් සහිතව ඉදිකෙරෙන කඩවත සිට කෙරවලපිටිය දක්වා වූ පිටත වටරවුම් මහා මාර්ගයේ තුන්වන අදියරේ ඉදිකිරීම් කටයුතු 2018 ජූනි මස අවසානය වන විට සියයට 63 ක පමණ සමස්ත භෞතික ප්‍රගතියක් පෙන්නුම් කරමින් අඛණ්ඩව ක්‍රියාත්මක විය. පිටත වටරවුම් මහා මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2019 වසරේ ජූනි මස වන විට අවසන් වීම සමඟ කොළඹ නාගරික කලාපය තුළ රථවාහන තදබදය සැලකිය යුතු මට්ටමකින් අඩු වනු ඇතැයි බලාපොරොත්තු වේ.

**3.2 සංඛ්‍යා සටහන**

**මාර්ගස්ථ මගී ප්‍රවාහන අංශයේ ක්‍රියාකාරිත්වය**

| අයිතමය | 2017 ජන-ජූනි | 2018 ජන-ජූනි (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලං.ග.ම)** | | | |
| ධාවන කිලෝමීටර් (මිලියන) | 219 | 220 | 0.1 |
| මගී කිලෝමීටර් (මිලියන) | 7,709 | 7,582 | -1.6 |
| අයත් බස්රථ සංඛ්‍යාව | 7,608 | 7,308 | -3.9 |
| ධාවනය වූ බස්රථ සංඛ්‍යාවේ සාමාන්‍යය | 5,219 | 5,211 | -0.2 |
| **පෞද්ගලික අංශය** | | | |
| ධාවන කිලෝමීටර් (මිලියන) | 523 | 554 | 5.9 |
| මගී කිලෝමීටර් (මිලියන) | 26,346 | 27,668 | 5.0 |
| අයත් බස්රථ සංඛ්‍යාව | 19,917 | 20,088 | 0.9 |
| ධාවනය වූ බස්රථ සංඛ්‍යාවේ සාමාන්‍යය | 17,728 | 19,165 | 8.1 |
| පළාත් අතර ධාවනය සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව | 3,210 | 3,164 | -1.4 |
| පළාත තුළ ධාවනය සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව | 16,707 | 16,924 | 1.3 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

3

## මාර්ගස්ථ මගී ප්‍රවාහනය

- **පොදු මගී ප්‍රවාහනය 2018 වසරේ පළමු භාගයේදී මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** මගී කිලෝමීටර සහ ධාවනය කළ බස් රථ ප්‍රමාණය සලකා බැලීමේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙහි (ශ්‍රී ලං.ග.ම.) මෙහෙයුම් කටයුතුවල පසුබෑමක් වාර්තා විය. කෙසේ වෙතත්, ශ්‍රී ලං.ග.ම. හි ධාවන කිලෝමීටර ප්‍රමාණයේ සුළු ඉහළ යෑමක් වාර්තා විය. මේ අතර, මෙම කාලය තුළදී පෞද්ගලික අංශයේ බස් රථවල මගී කිලෝමීටර සහ ධාවන කිලෝමීටර ප්‍රමාණය ඉහළ ගියේය. 2018 ජූනි මස අවසන් වන විට පෞද්ගලික බස් ධාවනය සඳහා ලබාදී ඇති අන්තර් පළාත් බලපත්‍ර සහ පළාත තුළ ධාවනය සඳහා වන බලපත්‍ර සංඛ්‍යාව පිළිවෙළින් 3,164 ක් සහ 16,924 ක් විය. මේ අතර, දේශීය ඉන්ධන මිල ඉහළ නැංවීමත් සමග 2018 මැයි මස 23 සිට බලපැවැත්වෙන පරිදි පොදු සහ පෞද්ගලික යන දෙඅංශයේම බස් රථ සඳහා අදාළ වන බස් ගාස්තු මුල් වරට සංශෝධනය කරන ලදී. මේ අනුව, අවම බස් ගාස්තුව රුපියල් 10.00 සිට රුපියල් 12.00 දක්වා ඉහළ නංවන ලද අතර, අනෙකුත් කාණ්ඩ සඳහා ගාස්තුව සියයට 12.5 ක සාමාන්‍යයකින් ඉහළ නංවන ලදී. දේශීය වෙළඳපොළේ පවතින ඉහළ ඉන්ධන මිල සැලකිල්ලට ගනිමින් 2018 සැප්තැම්බර් 21 දින සිට බලපැවැත්වෙන පරිදි බස් ගාස්තු සියයට 4 කින් තවදුරටත් ඉහළ නංවන ලද අතර, අවම බස් ගාස්තුව නොවෙනස්ව පැවතුණි.

- **2018 වසරේ පළමු භාගය තුළදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව මාර්ගස්ථ මගී ප්‍රවාහනයේ ආවරණ ජාලය වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව පියවර ගන්නා ලදී.** 2018 වසරේ පළමු භාගය තුළදී නව 'සිසු සැරිය' සේවා 32 ක් දියත් කරන ලද අතර, එම වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ මුළු බස් රථ සංඛ්‍යාව 1,405 ක් විය. සාමාන්‍ය බස් රථ ගාස්තුවෙන් සියයට පනහක සහනදායී ගාස්තුවක් යටතේ පාසල් ළමුන් සඳහා පමණක් වෙන් වූ මෙම බස් සේවය, ගමනේ ආරක්ෂාව සහ විශ්වසනීයත්වය සහතික කරමින් උදෑසන සහ දහවල් කාර්යබහුල වේලාවන්වල මාර්ගවල අධික තදබදය අවම කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වේ. මේ අතර, සිය එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල සිට නගරවලට පැමිණෙන ජනතාවට අඛණ්ඩ, ලාභදායී හා විශ්වසනීය ප්‍රවාහන සේවයක් ලබා දෙන 'ගැමි සැරිය' බස් සේවාව යටතේ නව බස් රථ සේවා 10 ක් ආරම්භ කිරීමට 2018 වසරේ පළමු භාගය තුළදී අනුමැතිය ලබා දෙන ලදී. 'නිසි සැරිය' ව්‍යාපෘතිය යටතේ, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2018 වසර සඳහා දියත් කිරීමට සැලසුම් කළ නව බස් රථ සේවා 100 න් 24 ක් වසරේ පළමු භාගය තුළදී දියත් කරන ලදී. මීට අමතරව, 2018 ජූනි මස අවසන් වන විට 'නිසි සැරිය' බස් සේවා 154 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

- **2018 වසරේ පළමු මාස නවය තුළදී රථවාහන නව ලියාපදිංචිය පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව ඉහළ ගියේය.** 2018 වසරේ මුල් මාස නවය තුළ අලුතින් ලියාපදිංචි කළ මුළු වාහන සංඛ්‍යාව, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 9.0 කින් ඉහළ ගියේය. මෝටර් රථ, බස් රථ, ද්විත්ව කාර්ය වාහන සහ යතුරුපැදි ලියාපදිංචියෙහි දක්නට ලැබුණු ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන්

**3.3 සංඛ්‍යා සටහන**

**රථවාහන නව ලියාපදිංචිය**

| අයිතමය | 2017 ජන-සැප් | 2018 ජන-සැප් (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| බස් රථ | 2,356 | 2,383 | 1.1 |
| මෝටර් රථ | 29,684 | 63,863 | 115.1 |
| ත්‍රිරෝද රථ | 17,519 | 15,118 | -13.7 |
| ද්විත්ව කාර්ය වාහන | 12,613 | 13,302 | 5.5 |
| යතුරු පැදි | 262,012 | 263,004 | 0.4 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | 8,503 | 7,522 | -11.5 |
| ඉඩම් වාහන | 9,528 | 7,187 | -24.6 |
| ක්‍රොඩිසයිකල් සහා මෝටර් නිවාස | - | 654 | - |
| එකතුව | 342,215 | 373,033 | 9.0 |

(අ) තාවකාලික

මූලය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

හේතු විය. කෙසේ වෙතත්, ඉඩම් වාහන, ත්‍රිරෝද රථ සහ භාණ්ඩ ප්‍රවාහන වාහන ලියාපදිංචිය පහත වැටුණි. 2018 අයවැය මගින් කුඩා එන්ජින් ධාරිතාවක් සහිත වාහන සහ පරිසර හිතකාමී වාහන සඳහා ලබා දුන් හිතකර තීරුබදු ව්‍යුහය හේතුවෙන් කුඩා එන්ජින් ධාරිතාවක් සහිත වාහන, දෙමුහුන් සහ විද්‍යුත් වාහනවල ආනයනය ඉහළ ගියේය. කෙසේ වෙතත්, විදේශීය වෙළඳ ගිණුම මත ඇති වන අහිතකර බලපෑම පිළිබඳව සලකා බලා, සාමාන්‍යයෙන් වාණිජමය නොවන කටයුතු සඳහා භාවිතයට ගන්නා රථවාහන ආනයනයේ ඇති වූ විශාල වර්ධනය මැඩලීම සඳහා රජය හා මහ බැංකුව විසින් වසරේ දෙවන භාගය තුළදී පියවර කිහිපයක් ගන්නා ලදී.

## දුම්රිය ප්‍රවාහනය

- **2018 වසරේ පළමු භාගය තුළදී දුම්රිය ප්‍රවාහන අංශයේ මගී ප්‍රවාහන කටයුතුවල වර්ධනයක් වාර්තා විය.** දුම්රිය මගී කිලෝමීටර ප්‍රමාණය කිලෝමීටර බිලියන 3.7 ක් දක්වා සියයට 2.7 කින් ඉහළ ගියේය. දුම්රිය එන්ජින් හා මැදිරි අඛණ්ඩව නඩත්තු කිරීම සහ දුම්රිය මාර්ග හා දුම්රිය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මෙම සුළු වර්ධනය සඳහා දායක විය. කෙසේ වෙතත්, භාණ්ඩ ප්‍රවාහනය මෙට්‍රික් ටොන් කිලෝමීටර මිලියන 63.5 ක් දක්වා සියයට 10.2 කින් පහළ ගියේය.

- **කාර්යක්ෂම ප්‍රවාහන සේවා සැපයීමේ අරමුණින් දුම්රිය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර කිහිපයක් ගෙන ඇත.** මෙම වසරේ පළමු භාගය තුළදී දුම්රිය ස්ථාන ගොඩනැගිලි, පාලම්, සංඥා හා විදුලි සංදේශ පද්ධති ඉදිකිරීම හා නඩත්තු කිරීමේ කටයුතු ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී ලං.දු.සේ.) අඛණ්ඩව සිදු කරන ලදී. මෙයට අමතරව, සලකා බලන ලද කාලය තුළදී කටුනායක සිට මීගමුව

**3.4 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ක්‍රියාකාරිත්වය**

| අයිතමය | 2017 ජන-ජූනි | 2018 ජන-ජූනි (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| ධාවන කිලෝමීටර් (මිලියන) | 5.9 | 5.9 | -0.8 |
| මගී කිලෝමීටර් (මිලියන) | 3,639 | 3,738 | 2.7 |
| භාණ්ඩ ටොන් කිලෝමීටර් (මිලියන) | 70.6 | 63.5 | -10.2 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා දුම්රිය සේවය

දක්වා වන දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් ලෙස ගොඩනැගීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පැවති අතර, මහනුවර-පේරාදෙණිය-කඩුගන්නාව දුම්රිය මාර්ග කොටසේ ප්‍රතිසංස්කරණ කටයුතු ද ආරම්භ කෙරිණි. තවද, 2018 වසරේ පළමු භාගය තුළදී ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක කරන කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියට අදාළ මූලික කටයුතු ආරම්භ කෙරුණු අතර, මහව සිට ඕමන්තෙයි දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට සහ පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් ලෙස ගොඩනැගීමට අදාළ මූලික කටයුතු අවසන් කෙරිණි. මේ අතර, ඉඩම් කළමනාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලං.දු.සේ. විසින් දුම්රිය ඉඩම් මැනීමේ හා තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. මේ අතර, 2016 වසරේදී ආරම්භ කළ කැළණිවැලි දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ කටයුතු ද ශ්‍රී ලං.දු.සේ. අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.

## සිවිල් ගුවන් සේවය

- **පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගය තුළදී මගී හා භාණ්ඩ මෙහෙයවීම යන දෙඅංශයෙන්ම සිවිල් ගුවන් සේවා අංශය සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.** සංචාරක පැමිණීම් අඛණ්ඩව වර්ධනය වීම මේ සඳහා උපකාරී විය. ඒ අනුව, මෙම වසරේ පළමු භාගය තුළදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මගින් වෙනත් ගුවන්යානා වෙත මාරුවන මගීන් ද ඇතුළුව හසුරුවන ලද මුළු මගීන් ප්‍රමාණය මිලියන 6.4 ක් දක්වා සියයට 24.3 කින් ඉහළ ගියේය. මේ අතර, මෙම කාලය තුළදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මගින් මෙහෙයවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය සියයට 10.0 කින් ඉහළ ගියේය. තවද, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස හය තුළදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ මුළු ගුවන්යානා හැසිරවීම් ප්‍රමාණය 35,908 ක් දක්වා සියයට 19.4 කින්

ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2017 වසරේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ගුවන්යානා ධාවන පථය අර්ධ වශයෙන් වසා තැබීමත් සමග එම ගුවන් තොටුපොළ වෙත පැමිණි ගුවන්යානා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වෙත යොමු කිරීම හේතුවෙන් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විසින් හසුරුවන ලද ගුවන්යානා සංඛ්‍යාව 2017 වසරේ පළමු භාගයේදී වාර්තා වූ 980 ක ඉහළ අගයට සාපේක්ෂව මෙම වසරේ පළමු භාගය තුළදී 281 ක් පමණක් විය. මෙයට සමගාමීව, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ මගී හැසිරවීම් ප්‍රමාණය සියයට 96.6 කින් සැලකිය යුතු ලෙස අඩු විය. දේශීය ගුවන් ගමන් කටයුතුවලට අදාළ මුළු මගී හැසිරවීම් ප්‍රමාණය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 28.1 කින් ඉහළ ගියේය.

- **ගුවන් තොටුපොළ සංවර්ධන ව්‍යාපෘති 2018 වසරේ පළමු භාගය තුළදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.** බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ දුරස්ථ ගගනාංගනය හා ගුවන්යානා බැහැරුම් පථ ඉදිකිරීමේ කටයුතු 2018 වසරේ පළමු භාගය තුළදී ක්‍රියාත්මක වෙමින් පැවති අතර, එය 2019 වසරේ ඔක්තෝබර් මාසයේදී අවසන් කිරීමට අපේක්ෂිතය. තවද, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වඩාත් හොඳින් ප්‍රයෝජනයට ගැනීම පිණිස එය කළමනාකරණය කිරීමට හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ඉන්දීය ගුවන් තොටුපොළ අධිකාරිය (Airports Authority of India) සමග මේ වන විට සාකච්ඡා පැවැත්වේ. තවද, ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තියක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇති අතර, ඒ සඳහා පාර්ලිමේන්තු අනුමැතිය අපේක්ෂා කෙරේ. සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවේ ගුවන් සේවා කර්මාන්තයේ සියලු කටයුතු සඳහා ශක්තිමත් නීතිමය පසුබිමක් ලබා දෙනු ඇත. තවද, බිම් සැලැසුම් මෙන්ම, ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා වන ව්‍යාපාරික සැලසුමක් ද ඇතුළත් රත්මලාන ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රධාන සැලසුම සඳහා 2018 වසරේ පළමු භාගය තුළදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. තවද, 2018 මාර්තු මස සිවිල් ගුවන් මෙහෙයුම් සඳහා මඩකලපුව ගුවන් තොටුපොළ යළි විවෘත කෙරිණි.

## වරාය සේවා

- **කොළඹ වරායේ සියලුම බහලු පර්යන්තවල වාණිජ මෙහෙයුම් කටයුතුවල වර්ධනය පිළිබිඹු කරමින් 2018 වසරේ පළමු මාස නවය තුළදී වරාය ආශ්‍රිත කටයුතුවල සමස්ත ක්‍රියාකාරිත්වය වැඩිදියුණු විය.** 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2018 වසරේ පළමු මාස නවය තුළ කොළඹ වරායේ සමස්ත ක්‍රියාකාරිත්වය බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ භාණ්ඩ හැසිරවීම් යන අංශවලින් ගත් කළ පිළිවෙළින් සියයට 14.9 ක, සියයට 19.4 ක සහ සියයට 13.3 ක වර්ධනයක් වාර්තා කර ඇත. 2018 වසරේ පළමු මාස නවය තුළ කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය මගින් මෙහෙයවන ලද සමස්ත බහලු ප්‍රමාණය පිළිවෙළින් සියයට 13.2 කින් සහ සියයට 16.5 කින් වර්ධනය විය. ඒ අනුව, කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශ්‍රී ලං.ව.අ.) සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය විසින් කොළඹ වරායේ සමස්ත බහලු මෙහෙයුම්වලින් පිළිවෙළින් සියයට 37.8 ක්, සියයට 32.5 ක් සහ සියයට 29.7 ක් මෙහෙයවන ලදී. මේ අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස නවය තුළ කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය, දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය සහ ශ්‍රී ලං.ව.අ. විසින් සිදු කරන ලද බහලු ප්‍රතිනැව්ගත කිරීමේ කටයුතු පිළිවෙළින් සියයට 14.6 කින්, සියයට 21.1 කින් සහ සියයට 23.3 කින් වර්ධනය විය.

- **2017 වසරේ ජූලි මාසයේදී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් යටතේ හම්බන්තොට වරාය සංවර්ධනය කිරීම සහ මෙහෙයුම් සිදුකිරීම උදෙසා ශ්‍රී ලං.ව.අ. සහ රජය, China Merchants Port Holdings Company (CMPort) සමග අතර ඇති කර ගත් අනුග්‍රාහකත්ව ගිවිසුමෙන් පසු 2018 වසරේ පළමු මාස නවය තුළදී හම්බන්තොට වරාය සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.** 2017 වසරේ අනුරූප

### 3.5 සංඛ්‍යා සටහන
### වරාය සේවා ක්‍රියාකාරිත්වය

| අයිතමය | 2017 ජන-සැප් | 2018 ජන-සැප් (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| ශ්‍රී ලංකාවේ වරායන්ට පැමිණි නැව් සංඛ්‍යාව | 3,647 | 3,716 | 1.9 |
| මෙහෙයවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො. '000) | 69,337 | 77,949 | 12.4 |
| මුළු බහලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) (ආ) | 4,545 | 5,223 | 14.9 |
| බහලු ප්‍රතිනැව්ගත කිරීම් ප්‍රමාණය (TEUs '000) (ආ) | 3,523 | 4,207 | 19.4 |


(අ) තාවකාලික

(ආ) TEUs = අඩි විස්සට සමාන බහලු ඒකක

මූලය : ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**3.4 රූප සටහන**

**ශ්‍රී ලංකාවේ වරායන්වල බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය**




මූලයන්: ශ්‍රී ලංකා වරාය අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2018 වසරේ පළමු මාස නවය තුළ භාණ්ඩ ගොඩබෑම, භාණ්ඩ පැටවීම සහ භාණ්ඩ මෙහෙයුම් කටයුතු පිළිවෙළින් සියයට 82.8 ක, සියයට 156.1 ක හා සියයට 102.6 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. මේ අතර, දේශීය භාවිතය සඳහා ආනයනය කරන ලද රථවාහන මෙහෙයවීම සහ වාහන ප්‍රතිනැව්ගත කිරීම් පිළිවෙළින් සියයට 115.7 කින් සහ සියයට 88.6 කින් වර්ධනය වීම නිසා 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස නවය තුළදී හම්බන්තොට වරායේ මුළු වාහන හැසිරවීම සියයට 98.8 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී.

- **මුහුදු මාර්ග ඔස්සේ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම පිණිස 2018 වසරේ පළමු භාගයේදී ශ්‍රී ලංකාවේ වරායන් සංවර්ධනය කිරීම සඳහා පියවර කිහිපයක් ගෙන ඇත.** 2018 වසරේ පළමු භාගය තුළදී, තොටුපොළ බැම්ම නිම කිරීම ඇතුළත් වූ නැගෙනහිර බහලු පර්යන්තය සංවර්ධනය කිරීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක විය. කොළඹ හා ත්‍රිකුණාමල වරායන් සංවර්ධනය කිරීමේ සැලසුම් ද ඇතුළත් ජාතික වරාය පිළිබඳ ප්‍රධාන සැලසුම ජාත්‍යන්තර උපදේශකවරුන්ගේ තාක්ෂණික සහාය සහිතව සකස් කෙරෙමින් පවතී. තවද, 2018 වසරේ පළමු භාගයේදී ගාල්ල වරායේ සැහැල්ලු රුවල් යාත්‍රා නැංගුරම්පොළක් ඉදිකිරීම සඳහා යෝජනා කැඳවීම (Request for Proposals) ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මේ අතර, එදිනෙදා බහලු මෙහෙයුම් කටයුතු අඩපණවීම වැළැක්වීම සඳහා කොළඹ වරායේ ජය බහලු පර්යන්තය, විජය කුමරු තොටුපොළ සහ බණ්ඩාරනායක තොටුපොළවල බහලු රැස්කර තබන ප්‍රදේශ සහ මාර්ග පුනරුත්ථාපනය කිරීම අදියර කිහිපයක් යටතේ සිදු කෙරෙමින් පවතී.

## විදුලි සංදේශ සේවා

- **ප්‍රධාන වශයෙන් ජංගම දුරකථන හා අන්තර්ජාල සම්බන්ධතා ඉහළ යෑම හේතුවෙන් විදුලි සංදේශ අංශය 2018 වසරේ මුල් භාගය තුළදී අඛණ්ඩව වර්ධනය විය.** 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2018 වසරේ මුල් භාගයේදී ජංගම දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව සියයට 7.5 කින් ඉහළ ගිය අතර, රැහැන් සහිත ස්ථාවර දුරකථන සබඳතා ප්‍රමාණය සියයට 1.5 ක සුළු වර්ධනයක් වාර්තා කළේය. 2018 වසරේ පළමු භාගයේදී ද රැහැන් රහිත ස්ථාවර දුරකථන සබඳතා ගණන අඛණ්ඩව පහළ වැටුණි. 2018 ජුනි මස අවසානය වන විට ස්ථාවර දුරකථන ඝනත්වය (පුද්ගලයන් 100 කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව) සහ ජංගම දුරකථන ඝනත්වය, පිළිවෙළින් 11.7 ක් සහ 139.5 ක් විය. අන්තර්ජාල සේවා පිළිබඳව සැලකීමේදී, අන්තර්ජාල ඝනත්වය (පුද්ගලයින් 100 කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව) 30.3 ක් දක්වා ඉහළ නංවමින් 2018 ජුනි මාසයෙන් අවසන් වන මාස 12 තුළ මුළු අන්තර්ජාල සම්බන්ධතා ගණන සියයට 19.7 කින් වර්ධනය විය. 2018 ජුනි මස අවසානය වන විට, අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව වර්ධනය වීමට ස්ථාවර අන්තර්ජාල සබඳතා සහ ජංගම අන්තර්ජාල සබඳතා පිළිවෙළින් සියයට 25.6 කින් සහ සියයට 18.3 කින් වර්ධනය වීම දායක විය.

- **2018 වසරේ මුල් භාගය තුළදී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනයට අඛණ්ඩ සහායක් ලබා දෙන ලදී.** ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන

**3.6 සංඛ්‍යා සටහන**

**විදුලි සංදේශ සේවා**

| ග්‍රාහක සංඛ්‍යාව | 2017 ජුනි අවසානය | 2018 ජුනි අවසානය (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| ස්ථාවර දුරකථන ('000) | 2,514 | 2,531 | 0.7 |
| ජංගම දුරකථන ('000) | 28,113 | 30,209 | 7.5 |
| අන්තර්ජාල සම්බන්ධතා ('000) (ආ) | 5,479 | 6,561 | 19.7 |
| මුළු දුරකථන ඝනත්වය (ඇ) | 142.8 | 151.2 | 5.8 |
| ජංගම දුරකථන ඝනත්වය (ඇ) | 131.1 | 139.5 | 6.4 |


මූලයන් : ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික
(ආ) ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළත්ව
(ඇ) පුද්ගලයින් 100 කට ඇති සම්බන්ධතා ප්‍රමාණය

3

**3.5 රූප සටහන**

**දුරකථන සම්බන්ධතා (ස්ථාවර හා ජංගම) සහ අන්තර්ජාල සම්බන්ධතා**




මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ශ්‍රී ලංකා මහ බැංකුව

කොමිෂන් සභාව, එහි කොළඹ ප්‍රධාන කාර්යාලය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ මූලික සැලසුම් සටහන් සැකසීම අවසන් කරන ලද අතර, ඉදිකිරීම සඳහා අවශ්‍ය සංවර්ධන බලපත්‍ර ලබා ගැනීමේ ක්‍රියාවලියේ නියැලී සිටියේය. රටෙහි ඩිජිටල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කරන අතරම, ලංකා රාජ්‍ය ජාල 2.0 (Lanka Government Network 2.0) ව්‍යාපෘතිය, ලංකා රාජ්‍ය ක්ලවුඩ් (Lanka Government Cloud) 2.0 ව්‍යාපෘතිය, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ කළමනාකාරිත්ව පද්ධතියෙහි ව්‍යාපාර ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සඳහා වූ අධ්‍යයනය, විද්‍යුත් රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශය හා මහජන අදහස් විමසීම් වැඩමුළුව, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලබා දෙන සේවා කාර්යක්ෂම කිරීමට වෙබ් අඩවි 358 ක් ක්ලෝන කිරීම ඇතුළු ව්‍යාපෘති කිහිපයක්ම 2018 වසර තුළදී අවසන් කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, රාජ්‍ය විද්‍යුත් සේවා කිහිපයක් ආරක්ෂිත තොරතුරු ජාලයක් ඔස්සේ සැපයීමට අපේක්ෂිතය. තවද, සිසුන් සහ ගුරුවරුන් අතර ඩිජිටල් සාක්ෂරතාවය ඉහළ නැංවීම, දෛනිකව භාවිතා කරන උපකරණ අතර අන්තර්ජාලය හරහා තොරතුරු හුවමාරු කිරීමෙන් එම උපකරණවල අන්තර් සම්බන්ධතා වැඩි කිරීම (Internet of Things) සහ සයිබර් ආරක්ෂණය ආදිය පිළිබඳ දැනුම්වත්භාවය ද ඇතුළත්ව, ශ්‍රී ලංකාවේ ඩිජිටල් උපායමාර්ගය හා සම්බන්ධ ව්‍යාපෘති කිහිපයක්ම අඛණ්ඩව පවත්වාගෙන යෑමට විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් සහ විදේශ රැකියා පිළිබඳ අමාත්‍යාංශය මගින් 2018 වසරේ පළමු භාගය තුළදී පියවර ගන්නා ලදී.

## සමාජ යටිතල පහසුකම් සංවර්ධනය

### සෞඛ්‍ය

- 2018 වසරේ පළමු භාගය තුළදී රජයේ සෞඛ්‍ය අංශයෙහි පවතින මානව සම්පත් හා භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රජය අඛණ්ඩව කටයුතු කළේය. 2018 ජූනි මස අවසානය වන විට පුද්ගලයින් 1,100 කට එක් වෛද්‍යවරයෙක් සහ පුද්ගලයින් 624 දෙනෙකුට එක් හෙද සේවකයෙක් බැගින් වූ පරිදි සුදුසුකම්ලත් වෛද්‍යවරුන් 19,692 ක් සහ හෙද සේවකයින් 34,714 ක් රජයේ රෝහල්වල සේවය කළහ. පුද්ගලයින් 1,000 කට ඇඳන් 3.5 ක් වන ලෙස ඇඳන් 76,824 ක් රජයේ රෝහල්වල පැවතුණි. තවද, 2018 වසරේ ජූනි මස අවසානය වන විට ඇඳන් 5,210 කින් සමන්විත රජයේ ආයුර්වේද වෛද්‍ය රෝහල් 102 ක් පැවති අතර, ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරු 25,378 ක් වූහ. මේ අතර, සෞඛ්‍ය සේවාවල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ විවිධ ව්‍යාපෘති කිහිපයක් ද 2018 වසරේ පළමු භාගය තුළදී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. සමාලෝචනයට ලක් වූ කාලපරිච්ඡේදය තුළදී මහනුවර ශික්ෂණ රෝහල, හලාවත සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මූලික රෝහල් වැනි ෆේබීය අමාත්‍යාංශ රෝහල්වල හදිසි ප්‍රතිකාර ඒකකවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවති අතර, කළුබෝවිල ශික්ෂණ රෝහලේ සහශ්‍ර වාට්ටු සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු සහ පොළොන්නරුව දිස්ත්‍රික් මූලික රෝහලෙහි සංවර්ධන කටයුතු ද අඛණ්ඩව සිදු කෙරිණි. මෙයට අමතරව, මහනුවර මහ රෝහලේ ඇට මිදුළු බද්ධ කිරීමේ ඒකකයක් ඉදිකිරීම සහ කරාපිටිය හා අම්පාර රෝහල්වල විශේෂිත ළමා සායන සංකීර්ණ පිහිටුවීම ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. මේ අතර, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාව පුනරුත්ථාපනය හා පුළුල් කිරීමේ කටයුතු සහ සෞඛ්‍ය අංශයේ දෙවන සංවර්ධන වැඩසටහන යටතේ වූ ක්‍රියාමාර්ග ද සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මෙයට අමතරව, රෝගීන්ට යම් සහනයක් සැලසීමේ අරමුණින් 2018 අගෝස්තු මස සිට වහාම ක්‍රියාත්මක වන පරිදි, තෝරාගත් අත්‍යවශ්‍ය ඖෂධවල මිල ගණන් අඩු කිරීමට රජය විසින් පියවර ගන්නා ලදී. කෙසේ වෙතත්, මිල ගණන් අඩු කිරීම හේතුවෙන්

ශ්‍රී ලංකාවට බාධාවකින් තොරව තත්ත්වයෙන් උසස් ආනයනික ඖෂධ සැපයෙන බව තහවුරු කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ස්කෑන් පරීක්ෂණ, රසායනාගාර පරීක්ෂණ හා ශල්‍යකර්ම වැනි පෞද්ගලික සෞඛ්‍ය සේවාවල මිල ගණන් නියාමනය කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීමට අපේක්ෂිතය.

- **සලකා බලන ලද කාලය තුළදී බෝවන රෝග වසංගත තත්ත්ව කිහිපයක් ශ්‍රී ලංකාවෙන් වාර්තා විය.** දරුණු ඉන්ෆ්ලුවෙන්සා වසංගත අවස්ථා කිහිපයකට මෙරට මුහුණ දුන් අතර, ඉහළම ඉන්ෆ්ලුවෙන්සා රෝග ව්‍යාප්තිය හා ඒ ආශ්‍රිත මරණ සංඛ්‍යාව දකුණු පළාතෙන් වාර්තා විය. මේ අතර, 2018 වසරේ පළමු මාස හතක කාලපරිච්ඡේදය තුළදී වාර්තා වූ මී උණ ආශ්‍රිත රෝගීන් සංඛ්‍යාව පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයේදී වාර්තා වූ රෝගීන් 1,666 ට සාපේක්ෂව රෝගීන් 2,579 දක්වා වර්ධනය විය. අනෙක් අතට, 2018 වසරේ පළමු මාස හත තුළදී ඩෙංගු රෝග ව්‍යාප්තිය පුද්ගලයින් 100,000 කට රෝගීන් 154 ක් වූ අතර, 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළදී එම සංඛ්‍යාව පුද්ගලයින් 100,000 කට රෝගීන් 597 ක වාර්තාගත ඉහළ මට්ටමක පැවතුණි. 2018 වසරේ ඩෙංගු ව්‍යාප්තියෙහි දරුණු බව අවම වීමට මහා පරිමාණ පරිශ්‍ර පරීක්ෂා කිරීමේ වැඩසටහන් හා ඒකාබද්ධ වාහක පාලන උපක්‍රම, මදුරුවන් බෝවන ස්ථානවල හිමිකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සහ මාධ්‍ය ආයතනවල සහාය ද සහිතව පවත්වන ලද මහජනතාව දැනුම්වත් කිරීමේ ක්‍රියාවලි ද උපකාර විය. ඉහළ යන ඩෙංගු රෝගීන් සංඛ්‍යාව සහ වසංගත තත්ත්ව කල්තබා හඳුනා ගැනීම සඳහා ලේඛනගත රෝග ආවේක්ෂණයට අමතරව, 2018 වසරේදී වසංගත රෝග විද්‍යා ඒකකයේ සහයෝගිත්වයෙන් වෙබ් අඩවිගත ආවේක්ෂණ පද්ධතියක් ද ශක්තිමත් කෙරිණි. දිවයිනේ සියලුම පළාත්වල තෝරාගත් රෝහල්වල දැඩි උපස්ථාන ඒකක (High Dependence Units) පිහිටුවීමට රජය රුපියල් මිලියන 200 ක් වෙන් කර ඇත. මේ අතර, වසරේ පළමු මාස හත තුළදී ඩෙංගු රෝගය ආශ්‍රිතව මරණ 40 ක් වාර්තා වූ අතර, ඒ අනුව, ඩෙංගු මරණ අනුපාතිකය ද 2017 වසරේ පළමු මාස හත තුළ වාර්තා වූ සියයට 0.28 ක අගයක සිට මෙම වසරේ එම කාලපරිච්ඡේදයේදී සියයට 0.12 ක අගයක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය.

- **සෞඛ්‍ය සේවා සැපයීමේදී පෞද්ගලික අංශය අඛණ්ඩව සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළේය.** 2018 වසරේ ජූනි මස අවසානය වන විට, ඇඳන් 334 කින් සමන්විත පෞද්ගලික ආයුර්වේද වෛද්‍ය රෝහල් 15 ක් ඇතුළත්ව, ඇඳන් 5,095 කින් යුතු ලියාපදිංචි කරන ලද පෞද්ගලික රෝහල් 191 ක් ක්‍රියාත්මක විය. 2018 ජූනි මස අවසානය වන විට පෞද්ගලික වෛද්‍ය හා වෛද්‍ය සේවා මධ්‍යස්ථාන 144 ක් සහ පූර්ණකාලීන හා අර්ධකාලීන වෛද්‍ය සායන 381 ක් පැවති අතර, පෞද්ගලික වෛද්‍ය රසායනාගාර 291 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

3

### අධ්‍යාපනය

- **රජයේ පාසල් විසින් සපයනු ලබන සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා රජය විසින් අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී.** රජය විසින් නවක ගුරුවරුන් 492 ක් බඳවාගන්නා ලද අතර, විශේෂයෙන්ම, විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු හා ගණිත අධ්‍යාපනය සහ නායකත්ව හා කළමනාකරණය පිළිබඳව ගුරුවරුන්, පාසල් විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන සේවා සපයන පළාත් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී. මේ අතර, අධ්‍යාපන සේවාවල ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශය, කලාප හා කොට්ඨාස අධ්‍යාපන නිලධාරීන් විසින් සිදු කරනු ලබන බාහිර ඇගයීම් ක්‍රමවේදය යටතේ ආසන්න වශයෙන් ගුරුවරුන් 24,260 ක් ඇගයීමට ලක් කර ඇත. මේ අතර, 2018 වසරේ ජූනි මස අවසානය වන විට පාසල්වල භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිණිස දරන ලද පිරිවැය රුපියල් බිලියන 10.4 ක් විය.

- **වසර 13 ක අනිවාර්ය අධ්‍යාපනයක් ලබා දීමේ වැඩසටහන ඵලදායීව සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම පිණිස ගුරු කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව පැවතීම මධ්‍යයේ වුවද, එම වැඩසටහන 2018 පළමු භාගය තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක විය.** මූලික, අතරමැදි හා උසස් මොඩියුල තුළින් ඉගැන්වීම් සිදු කරනු ලබන පොදු විෂයයන් නවයකින් සහ ව්‍යවහාරික විෂය ඒකකවලින් සමන්විත නව වෘත්තීය විෂය ධාරාවක් අ.පො.ස. උසස් පෙළ සඳහා හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන හා සම්බන්ධ නියමු

ව්‍යාපෘතියේ පළමු අදියර 2017 වසරේදී පාසල් 42 ක ක්‍රියාත්මක කරන ලද අතර, දෙවන අදියර 2018 වසරේදී පාසල් 153 ක ක්‍රියාත්මක කරන ලදී. තවද, නියමු ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියරේදී විෂයයන් ඉගැන්වීම සඳහා දැනට සිටින ගුරු කාර්ය මණ්ඩලයෙන් පිළිවෙළින්, ගුරුවරුන් 850 ක් හා 1,274 ක් පුහුණු කරවන ලදී.

- **රෝග, අනතුරු හා අනෙකුත් තුවාලවීම්වලට අදාළව පාසල් දරුවන්ට රක්ෂණ ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින් රජය විසින් සුරක්ෂා පාසල් සිසු සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන හඳුන්වා දෙන ලදී.** වයස අවුරුදු 5 සිට 19 අතර සියලුම රජයේ පාසල්, රජයේ ආධාර ලබන හෝ නොලබන පෞද්ගලික පාසල්, පිරිවෙන්, රජයේ ආධාර ලබන විශේෂ පාසල් සහ ජාත්‍යන්තර පාසල්වල 1 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන සියලුම සිසුන් මෙම සෞඛ්‍ය රක්ෂණය ලැබීම සඳහා සුදුසුකම් ලබන අතර, මෙමගින් එක් ශිෂ්‍යයෙකු සඳහා රුපියල් 200,000 ක උපරිම රක්ෂණ ආවරණයක් ලබා දෙයි. ඒ අනුව, රජයේ පාසල් 10,194 ක, රජයේ අනුමැතිය ලත් පෞද්ගලික පාසල් 80 ක, පිරිවෙන් 753 ක සහ ජාත්‍යන්තර පාසල් 220 ක සිසුන් මිලියන 4.45 ක් මෙම රක්ෂණ ක්‍රමය මගින් ආවරණය කර ඇත.

- **රජයේ විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන අධ්‍යාපන සේවාව දියුණු කිරීම සඳහා රජය පියවර ගෙන ඇත.** 2018 වසරේ පළමු භාගය තුළදී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විද්‍යාව ආශ්‍රිත අධ්‍යයන වැඩසටහන් ශක්තිමත් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නව උපාධි පාඨමාලා තුනක්, පශ්චාත් උපාධි පාඨමාලා හතරක්, නව දෙපාර්තමේන්තු 19 ක් සහ වෛද්‍ය පීඨයක් අනුමත කරන ලදී. 2017 වසරේදී පවත්වන ලද අ.පො.ස. උසස් පෙළ විභාගය පදනම් කර ගනිමින් 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 30,141 ක් තෝරා ගෙන ඇති අතර, අතිරේක බඳවා ගැනීම් යටතේ තවත් සිසුන් 372 ක් ඇතුළත් කර ගැනීමට යෝජිතය. මේ අතර, විශ්වවිද්‍යාල ප්‍රවේශයේ කාර්යක්ෂමතාව හා විනිවිදභාවය සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කරනු ලබන සිසුන් හඳුනා ගැනීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමග එක්ව කටයුතු කිරීමටත්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කරුවන් අයත් වන දිස්ත්‍රික්කය තීරණය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවෙන් ඡන්ද හිමි නාම ලේඛනය ලබාගැනීමටත් කටයුතු කරන ලදී. මේ අතර, කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධව දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයක් පිහිටුවන ලදී. තවද, රාජ්‍ය විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකක සහ ආයතනික හා වැඩසටහන් සමාලෝචනය කිරීම සඳහා උපකාරී වෙමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලය විසින් ගුණාත්මක ප්‍රමිති සහ මිණුම් ස්ථාපනය කිරීමේ කාර්යයෙහි අඛණ්ඩව නිරත විය.

- **රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ පවත්නා සීමිත අවස්ථාවන් සැලකීමේදී පෞද්ගලික අංශය, තෘතියික අධ්‍යාපන අංශය තුළ සැලකිය යුතු කාර්යභාරයක් අඛණ්ඩව සිදු කළේය.** 2018 වසරේ ජූලි මස මැද වන විට දේශීය උපාධි පාඨමාලා 120 ක් පිරිනමනු ලබන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 17 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. සමාලෝචනයට ලක් වූ කාලපරිච්ඡේදය තුළදී, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන පහකට අදාළව නව ප්‍රථම උපාධි වැඩසටහන් 21 ක් ප්‍රතීතනය (accreditation) කර ඇත. මේ අතර, දකුණු ආසියාතික තාක්ෂණ සහ වෛද්‍ය ආයතනයේ එම්.බී.බී.එස්. උපාධි වැඩසටහන සඳහා ඇතුළත්වීමට මූලික සුදුසුකම් ලැබූ සහ 2009 සැප්තැම්බර් 15 සහ 2017 මැයි 15 අතර කාලසීමාව තුළදී ලියාපදිංචි වූ සිසුන්ට, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි එම්.බී.බී.එස්. උපාධි වැඩසටහන දක්වා දිවෙන අධ්‍යයන වැඩසටහන් හැදෑරිය හැකි වන පරිදි, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට ඔවුන් ඇතුළත් කර ගැනීමට රජය විසින් තීරණය කරන ලදී. රාජ්‍ය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට අමතරව, වෙනත් පෞද්ගලික ආයතන කිහිපයක් විසින් විදේශීය විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි සුදුසුකම් ලබා දෙන වැඩසටහන් පවත්වන ලදී.

- **2018 වසරේ ජුනි මස අවසානය වන විට කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු අංශය ලියාපදිංචි ආයතන 873 කින් සමන්විත වූ අතර, ඒ අතරින් ආයතන 388 ක් රාජ්‍ය ආයතන විය.** මෙම ආයතන මගින් 2018 වසරේ

පළමු භාගය තුළදී පිරිනමන ලද පිළිගත් පාඨමාලා සංඛ්‍යාව 1,888 කි. සම්පත් සීමිත වීම හේතුවෙන් රාජ්‍ය අංශයේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතන වලින් පමණක්ම ප්‍රමාණවත් පරිදි ලබා දිය නොහැකි ඉහළ ඉල්ලුමක් සහිත කුසලතා පිළිබඳ පුහුණුව ලබා දීම අරමුණු කර ගනිමින් කුසලතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශය විසින් 'පුහුණු මිලදී ගැනුම් ආකෘතිය' (Training Purchase Model) නමින් නව පුහුණු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, රාජ්‍ය හෝ පෞද්ගලික කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතනවලින් පිරිවැය බෙදාගැනීමේ පදනම මත සිය ශ්‍රමිකයන් පුහුණු කරවීමට පෞද්ගලික අංශයේ සේවායෝජකයන් දිරිගැන්වීමක් මෙමගින් සිදු වේ. මේ අතර, 2018 වර්ෂය අවසානය වන විට කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ප්‍රතිපත්ති රාමුව යාවත්කාලීන කිරීමට ද අපේක්ෂා කෙරේ. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් විශේෂයෙන්ම, උතුරු, උතුරු මැද හා ඌව පළාත්වල තරුණයින් සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී.

## නිවාස හා නාගරික සංවර්ධනය

- **අදාළ රජයේ අමාත්‍යාංශ යටතේ 2018 වසරේ පළමු භාගය තුළදී නාගරික සංවර්ධන සහ නිවාස ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක විය.** ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් තදාසන්න නගරවල මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක 'සුබිත පුරවර' කුඩා නගර සංවර්ධන වැඩසටහන යටතේ 2018 වසරේ පළමු මාස හත තුළදී උප ව්‍යාපෘති 455 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 343.6 ක් වැය කර ඇත. තවද, අනුරාධපුරය, ගාල්ල, යාපනය හා මහනුවර නගරවල ක්‍රමෝපායික නගර සංවර්ධන ව්‍යාපෘතිය ද ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මේ අතර, 2018 වසරේ පළමු භාගය තුළදී නිවාස ව්‍යාපෘති කිහිපයක ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පැවතුණි. තවද, මෙම කාලපරිච්ඡේදය තුළදී නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය විසින් කුඩා පරිමාණ ආදර්ශ ගම්මාන ව්‍යාපෘති රැසක ඉදිකිරීම් අවසන් කර විවෘත කරන ලදී.

- **සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළදී නගරාශ්‍රිත ප්‍රවාහනය වැඩිදියුණු කිරීම හා සම්බන්ධ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක විය.** ඒ අනුව, මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාකුඹුර බහු මාදිලි ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම, කොට්ටාව - හෝකන්දර මාර්ගය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය හා කොට්ටාව - මාලඹේ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන පැවතුණි. තවද, මාලඹේ සිට කොළඹ කොටුව දක්වා කුලුනු මතින් දිවෙන දුම්රිය මාර්ගයක් ඉදිකිරීම අරමුණු කර ගත් සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතියට අදාළ මූලික වැඩකටයුතු 2018 වසරේ පළමු භාගය තුළදී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ඒ අනුව, විස්තරාත්මක ශක්‍යතා අධ්‍යයන වාර්තාව, පාරිසරික බලපෑම් ඇගයීම වාර්තාව සහ නැවත පදිංචි කිරීම පිළිබඳ ක්‍රියාකාරී සැලසුම් අවසන් කර ඇති අතර, ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ සමීක්ෂණය ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය වසර 2026 වන විට අවසන් කිරීමට අපේක්ෂිතය.

- **2018 වසරේ පළමු භාගය තුළදී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කෙරිණි.** මීතොටමුල්ල කසල ගොඩකරන බිම වසා දමා කොළඹ අගනගරාශ්‍රිත ප්‍රදේශය, තදාසන්න ප්‍රදේශ සහ පුත්තලම දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවලින් එක්රැස් කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා අරුවක්කාලු ප්‍රදේශයේ කසල ගොඩකරන භූමියක් සංවර්ධනය කිරීම සඳහා පියවර ගෙන ඇත. 2018 වසරේ ජූනි මාසය අවසානය වන විට එම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 15 ක් විය. මේ අතර, පෞද්ගලික අංශයේ සමාගම්වල දායකත්වය සහිතව අපද්‍රව්‍යවලින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘති දෙකක් ආරම්භ කර ඇත. කසල කළමනාකරණය සම්බන්ධයෙන්, තෝරාගත් ව්‍යාපෘති සමාගම් සමග ලං.වි.ම. විසින් විදුලිය මිලදී ගැනීමේ සම්මත ගිවිසුම්වලට එළඹෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, කොළඹ මහනගර සභාව විසින් අනුග්‍රාහකත්ව ගිවිසුම්වලට අත්සන් තබනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය 2018 වසරේ පළමු භාගය තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක විය.** ඒ අනුව, 2018 වසරේ සැප්තැම්බර් මාසය අවසානය වන විට භූමිය ගොඩකිරීමේ වැඩකටයුතුවලින් සියයට 90 කට වැඩි ප්‍රමාණයක් හා දියකඩනය ඉදිකිරීම ආශ්‍රිත කටයුතුවලින් සියයට 70 ක් අවසන් වී පැවතුණි. භූමිය ගොඩකිරීමේ කටයුතු 2019 වසර මැද භාගය වන විට අවසන් කිරීමට අපේක්ෂිතය.


3

## සමාජ ආරක්ෂණ ජාල වැඩපිළිවෙළ සහ දිළිඳුකම තුරන් කිරීම

- මෙරට සමස්ත දරිද්‍රතා මට්ටම් අඛණ්ඩව පහත වැටුණ ද, සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා පවතින දුබලතා හා විෂමතාවලට ඉලක්කගත වැඩසටහන් තුළින් විසඳුම් සෙවිය යුතුව ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නවතම ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2016 ට අනුව, ජනගහන දරිද්‍රතා දර්ශකය, 2012/13 සමීක්ෂණ කාලයේදී වාර්තා වූ සියයට 6.7 ට සාපේක්ෂව සියයට 4.1 ක අගයක පැවතුණි. කෙසේ වෙතත්, ප්‍රාදේශීය වශයෙන් අඛණ්ඩව විෂමතා දැකිය හැකි වූ අතර, කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ සියයට 18.2 ක ඉහළම ජනගහන දරිද්‍රතා දර්ශකයට සාපේක්ෂව අවම ජනගහන දරිද්‍රතා දර්ශකය වූ සියයට 0.9 කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. මේ අතර, නිරපේක්ෂ වශයෙන් ගත් කළ, දරිද්‍රතා රේඛාවට පහළින් සිටි ජන සංඛ්‍යාව 843,913 ක් විය. කෙසේ වෙතත්, ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් දරිද්‍රතා රේඛාවට මදක් ඉහළින් සිටින අතර, ස්වාභාවික ව්‍යසන වැනි අහිතකර කම්පනවලදී ඔවුන් දරිද්‍රතා රේඛාවට වඩා පහළට වැටීමේ අවදානමක් ඇත. ලෝක බැංකුවට අනුව, ශ්‍රී ලංකාවේ අන්ත දරිද්‍රතාව, එනම් දිනකට එ.ජ. ඩොලර් 1.90 (2011 ක්‍රය ශක්ති සාම්‍යයට අනුව) සීමාවට වඩා අඩු මට්ටමක ජීවත්වන ජන ප්‍රතිශතය, 2016 වසර සඳහා සියයට 0.7 ක් විය. මේ අතර, මධ්‍යස්ථ දරිද්‍රතාව, එනම් දිනකට එ.ජ.ඩොලර් 3.20 (2011 ක්‍රය ශක්ති සාම්‍යයට අනුව) සීමාවට පහළින් සිටින ජන ප්‍රතිශතය, 2016 වසර සඳහා සියයට 9.5 ක් වූ අතර, මිලියන 2 ක පමණ ජනගහනයක් මධ්‍යස්ථ දරිද්‍රතාව හා සම්බන්ධ ජාත්‍යන්තර සීමාවට පහළින් සිටින බව එමගින් නිරූපණය කරයි.


- 2018 වසරේ පළමු භාගය තුළදී සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් මිලියන 1.4 කට පමණ රුපියල් බිලියන 19.7 ක අරමුදල් ලබා දී ඇති අතර, සමෘද්ධි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් 87,706 කට රුපියල් මිලියන 436 ක් ලබා දී ඇත. මේ අතර, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් 2018 වසරේ පළමු භාගය තුළදී රුපියල් බිලියන 2.3 ක පිරිවැයක් යටතේ ගර්භණී මව්වරුන්ට පෝෂණ ආහාර මලු ලබාදීමට අඛණ්ඩව පියවර ගන්නා ලදී. කෙසේ වෙතත්, මෙම වැඩසටහන් හමුවේ වුවද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජනගහන හා සෞඛ්‍ය සමීක්ෂණය - 2016 ට අනුව, වයස අවුරුදු පහට අඩු දරුවන් අතර මිටි බව, අඩු බර හා කෘෂ බව සියයට 15 කට වැඩි මට්ටමේ පැවතුණි. මේ අතර, තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව වසර 2030 වන විට දිළිඳුකම සපුරා තුරන් කිරීමේ අරමුණින්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සවිබල ගැන්වීමේ සැලසුමක් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, ප්‍රතිලාභී පවුල් සවිබල ගැන්වීමේ අරමුණින් වසරේ පළමු භාගය තුළදී රුපියල් මිලියන 58.9 ක පිරිවැයක් යටතේ ව්‍යාපෘති 218 ක් ක්‍රියාත්මක කරන ලදී.

**3.6 රූප සටහන**
**ජනගහන දරිද්‍රතා දර්ශකය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**3.7 රූප සටහන**
**සමෘද්ධි / දිවිනැගුම සුභසාධන වැඩසටහනේ ක්‍රියාකාරිත්වය**




මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## අපේක්ෂිත වර්ධනයන්

- **මිල සූත්‍රය පාදක කර ගනිමින් දේශීය ඛනිජ තෙල් මිල ගණන් නියම කිරීම අඛණ්ඩව සිදු කිරීම අත්‍යවශ්‍ය වන අතර, ලං.වි.ම. සැලකිය යුතු මූල්‍ය අලාභ ලැබීම සහ එහි ඉහළ යන ණය ප්‍රමාණය නිසා විදුලිබලය සඳහා ද පිරිවැය පිළිබිඹු වන පරිදි ගාස්තු නිර්ණය කිරීමේ යාන්ත්‍රණයක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කෙරෙයි.** 2014 වසරේ සිට විදුලි ගාස්තු සංශෝධනය කර නොමැති අතර, දැනට පවතින ගාස්තු ඒ සඳහා වැය වන පිරිවැයට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. ලං.වි.ම. අඛණ්ඩ අලාභ ලැබීම එහි මූල්‍ය ශක්‍යතාව කෙරෙහි අභියෝග ඇති කරනු පමණක් නොව, අනෙකුත් සම්බන්ධිත ආයතනවල ද්‍රවශීලතා කළමනාකරණය සහ මූල්‍ය ක්‍රියාකාරිත්වය කෙරෙහි ද බලපෑමක් ඇති කරයි. ලං.වි.ම. විසින් විශාල වශයෙන් ණය ගැනීම, රාජ්‍ය බැංකුවල ශේෂ පත්‍ර දුර්වලවීමට මෙන්ම ආර්ථිකයේ අනෙකුත් අත්‍යවශ්‍ය ආයෝජන සඳහා මුදල් ලැබීම් අඩු කිරීමට ද හේතු වේ. එබැවින්, ලං.වි.ම. හි මූල්‍ය ශක්‍යතාව සහතික කිරීමට සහ මෙම රජය සතු වාණිජ ව්‍යවසාය විසින් ලබන අලාභ හේතුවෙන් ඇති වන අනෙකුත් සාර්ව ආර්ථික ගැටලු විසඳීම සඳහා පිරිවැය පිළිබිඹු වන පරිදි ගාස්තු නිර්ණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම මේ අවස්ථාවේදී අත්‍යවශ්‍ය වේ.

- **සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සහයෝගිත්වයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සුභසාධක වැඩසටහන් අධීක්ෂණය කිරීම හා වඩා හොඳින් ඉලක්කගත කිරීම සඳහා රජයට ඇති හැකියාව ඉහළ නැංවීමටත්, එමගින් සමාජ ආරක්ෂණය සහ සමාජ ආරක්ෂණ ජාලවල කාර්යක්ෂමතාව, සාධාරණ බව හා විනිවිදභාවය වැඩිදියුණු කිරීමත් අරමුණු කරගනිමින් සමාජ තොරතුරු ලේඛනයක් සැකසීමේ කටයුතුවල නිරතව සිටියි.** මෙම සමාජ තොරතුරු ලේඛනය, සුභසාධන වැඩසටහන් සඳහා සුදුසුකම් ලත් හෝ සුදුසුකම් ලැබිය හැකි පුරවැසියන්ගේ තනි ලේඛනයක් වන අතර, එහි ඇතුළත් වන ආර්ථික ලක්ෂණ හා පවුල් ව්‍යුහය වැනි බහුමාන දත්ත පදනම් කරගනිමින් ප්‍රතිලාභීන් තෝරා ගැනීමට අපේක්ෂා කෙරෙයි. රාජ්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන, රජයෙන් අරමුදල් සැපයෙන සමාජ සුභසාධන වැඩසටහන් රැසක් මෙම තොරතුරු ලේඛනය මගින් ආවරණය කෙරෙනු ඇත. මෙම තොරතුරු ලේඛනය මගින් සාධාරණ හා විනිවිදභාවයකින් යුතුව සුභසාධන ප්‍රතිලාභීන් හඳුනා ගැනීමට හැකි වන අතර, එමගින් ප්‍රතිලාභ ලැබිය යුතු ගෘහ ඒකක වෙත ප්‍රතිලාභ හිමි වන බව තහවුරු වනු ඇත. සුභසාධක ප්‍රතිලාභ පද්ධතිය තුළට නව ප්‍රතිලාභීන් එක් කිරීමට හා ප්‍රතිලාභ අවශ්‍ය නොවන ගෘහ ඒකක ක්‍රමයෙන් පද්ධතියෙන් ඉවත් කිරීමටත් හැකියාව සලසමින් මෙම තොරතුරු ලේඛනය වරින් වර යාවත්කාලීන කෙරෙනු ඇත. තවද, දුක්ගැනවිලි මෙහෙයවීමේ පද්ධතියක් මෙම සමාජ තොරතුරු ලේඛනය සමගම සකස් කෙරෙන අතර, එය අභියාචනා යාන්ත්‍රණයකින් සහ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් නොමැති නමුත් ප්‍රතිලාභ ලබන පුද්ගලයන් පිළිබඳ වාර්තා කළ හැකි පද්ධතියකින් ද සමන්විත වනු ඇත.

- **මහා පරිමාණ මාර්ග සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් මධ්‍ය කාලීනව ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.** රුවන්පුර අධිවේගී මාර්ගය, කුලුනු මතින් දිවෙන වරාය ප්‍රවේශ මහාමාර්ගය, සමුද්‍රාසන්න මාර්ගය (Marine Drive) දෙහිවල සිට පානදුර දක්වා දීර්ඝ කිරීම සහ බේස්ලයින් පාර කොළඹ - හොරණ පාර ඉක්මවා රත්මලාන දක්වා දීර්ඝ කිරීම වැනි ව්‍යාපෘති සඳහා මේ වන විට සැලසුම් සකස් කෙරෙමින් පවතී. කිලෝමීටර 74 ක දිගකින් යුතු යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය, කහතුඩුවේදී දක්ෂිණ අධිවේගී මාර්ගය හා සම්බන්ධ කෙරෙමින් පැල්මඩුල්ල දක්වා විහිදෙනු ඇත. මේ අතර, නව කැළණි පාලම හා පිටත වටරවුම් මහාමාර්ගය සම්බන්ධ කරමින් කුලුනු මතින් දිවෙන වරාය ප්‍රවේශ මහාමාර්ගය ඉදිකිරීමට යෝජනා වී ඇති අතර, එය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වනු ඇත. පළමු අදියර යටතේ නව කැළණි පාලම හා රාජගිරිය සම්බන්ධ කෙරෙන අතර, දෙවන අදියර රාජගිරිය සිට අතුරුගිරිය දක්වා ඉදිකෙරෙනු ඇත. මෙම මාර්ග සංවර්ධන ව්‍යාපෘති මගින් ප්‍රදේශ අතර සම්බන්ධතාව වැඩිදියුණු කරමින් කොළඹ නගරය තුළ හා තදාසන්න ප්‍රදේශවල රථවාහන තදබදය අඩු කිරීම අරමුණු කරයි. කෙසේ වුවද, රටේ ආර්ථික කටයුතුවල ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා උපකාරී වෙමින් රථවාහන තදබදය හා ඉන්ධන භාවිතය අඩු කිරීමේ අරමුණින් පොදු ප්‍රවාහන පද්ධති වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය වේ.

3